අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

**කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ කළමනාකාර සහකාර - තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ 1 සේවා ගණයේ කම්කරු විනිශ්චය සභා ලසු ලේඛක තනතුර සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2026**

**1.0** 2020.02.13 දිනැති PSC/EST/06-01-32/05/2019 දරන ලිපිය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලද බඳවා ගැනීමේ පටිපාටියේ 08 ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව කම්කරු විනිශ්චය සභා ලසු ලේඛක III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය විසින් 2026 ජූලි මාසයේ දී පැවැත්වීමට අපේක්ෂිත බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**2.0** කම්කරු විනිශ්චය සභා ලසු ලේඛක III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය මරදාන කාර්මික විද්‍යාලයේ දී පැවැත්වේ.

**3.0** **සුදුසුකම්** - කම්කරු විනිශ්චය සභා ලසු ලේඛක III ශ්‍රේණියේ ස්ථිර පත්වීමක් ලබා ඇති නිලධරයකු වීම.

**4.0** අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත් කම්කරු විනිශ්චයාධිකාර සභාපති/අතිරේක මහේස්ත්‍රාත් මගින් 2026.05.29 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **අධ්‍යක්ෂ, අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය, නො. 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"කම්කරු විනිශ්චය සභා ලසු ලේඛක තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2026"** යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

**5.0** විභාග අයදුම්කරුවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**6.0 (I)** **අයදුම්පත්** - ආදර්ශ අයදුම්පතේ අංක 1.0 සිට 2.3 තෙක් ඡේද පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි "A4" ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත පිළියෙල කළ යුතු ය. අයදුම්පත යතුරු ලියනය කර පිළියෙල කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතු ය. අයදුම්පත මේ සමඟ ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන සහ අසම්පූර්ණ තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කරන්න. තව ද සම්පූර්ණ කරනු ලබන විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත් අයදුම්කරු විසින් නැවත විමසා බැලිය යුතු අතර, එම අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**(II)** අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අයදුම්කරුවෙකු විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුසු බවට අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය.

සටහන - අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම ඔහු/ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

**(III)** පළමුවන වරට මෙම විභාගයට අයදුම්කරන නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් සම්පූර්ණ විභාගය සඳහා රු.500/- ක මුදලක් විභාග ගාස්තු වශයෙන් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ, මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176100199025184 ට බැර වන ලෙස මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා රිසිට්පත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතු ය. රිසිට් පතේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

**7.0** අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන කම්කරු විනිශ්චයාධිකාර සභාපති/අතිරේක මහේස්ත්‍රාත් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

**8.0** විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

**9.0** අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ලැබූ නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි කම්කරු විනිශ්චයාධිකාර සභාපති/අතිරේක මහේස්ත්‍රාත් විසින් රාජකාරි නිවාඩු ලබා දීමේ දී ඒ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 19 වගන්තියේ වන විධිවිධාන අදාළ කර ගත යුතු ය.

**10.0** අයදුම්කරුවන් විසින් විභාගය සඳහා අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**11.0** සාමාර්ථයක් සඳහා විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ක් ලබා ගත යුතු වේ.

සැ.යු: මෙම අවම ලකුණු සීමාව සම්බන්ධයෙන් ඉදිරියේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් වේ.

**12.0** රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම නිලධාරීන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන් පිළියෙල කර ගත යුතු අතර ඒවා එම භාෂාවෙන්ම පිරවිය යුතු ය.

**13.0** විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි පළ කිරීමට කටයුතු කරනු ඇත.

**14.0** විභාගය පිළිබඳ විස්තර -

| | විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01. | ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය (ඉංග්‍රීසි) | පැය 01 | 100 | *40% |
| 02. | ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය (සිංහල/දෙමළ) | පැය 01 | 100 | *40% |

*රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් වේ.

**15.0** විභාගය සඳහා වන නිර්දේශය -

| | විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|---|
| 01. | ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය (ඉංග්‍රීසි) | මිනිත්තු 05ක් තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 120ක වේගයෙන් ලඝු සටහනින් ලියා එම සටහන් මිනිත්තුවකට වචන 40 ක වේගයෙන් යතුරු ලියනය කිරීමේ හැකියාව මැන බැලීමේ පරීක්ෂණයකි. |
| 02. | ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය (සිංහල/දෙමළ) | මිනිත්තු 05ක අඛණ්ඩ කාලයක් තුළ විනාඩියකට වචන 90ක වේගයෙන් කියවනු ලබන ඡේදයක් ලඝු සටහනින් ලියා විනාඩියකට වචන 12ක වේගයෙන් එම සටහන් යතුරු ලියනය කිරීමේ හැකියාව මැන බැලීමේ පරීක්ෂණයකි. |

**16.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ලේකම්, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් තීරණය කරනු ඇත.

ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
2026..........03.......... මස.....17.... දින
නො.19,
ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත

කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ 1
සේවා ගණයේ කම්කරු විනිශ්චය සභා ලඝු ලේඛක තනතුර සඳහා වන
පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2026

**First Efficiency Bar Examination to the Post of Stenographer**
**Office of the Secretary Labour Tribunals - 2026**

ඔබ විභාගයට පෙනී සිටින විෂය/විෂයන්

| | |
|---|---|
| ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය (ඉංග්‍රීසි) | |
| ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය ( සිංහල/දෙමළ ) | |

(අදාළ කොටුව තුල √ ලකුණ යොදන්න)

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය -

ඉංග්‍රීසි - 01
සිංහල/දෙමළ - 02

(අදාළ කොටුව තුළ අංකය ලියන්න.)

---

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

.............................................................................................................................

(උදා - HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම් වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

.............................................................................................................................

(උදා - GUNAWARDHANA, H.M.S.K)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :

.............................................................................................................................

2.0 සේවා ස්ථානය හා ලිපිනය

2.1 කාර්යාලයේ/ දෙපාර්තුමේන්තුවේ/ ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

.............................................................................................................................

.............................................................................................................................

2.2 කාර්යාලයේ/ දෙපාර්තුමේන්තුවේ/ ආයතනයේ නම හා ලිපිනය ( සිංහලෙන්/ දෙමළෙන්) :

.............................................................................................................................

.............................................................................................................................

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

.............................................................................................................................

.............................................................................................................................

3.0 ස්ත්‍රී/ පුරුෂ භාවය - ස්ත්‍රී - 1

(අදාළ කොටුව තුළ අංකය ලියන්න.) පුරුෂ - 2

වෙනත් - 3

| |
|---|
| |

4.0 ජාතික හැඳුනුම්පත් අංකය -

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

5.0 දුරකථන අංකය - ජංගම :

ස්ථාවර :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |

6.0 පත්වීම් දිනය : ........................................................................................................................

7.0 7.1 ඔබ විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට ද? : ...........................................................................

7.2 විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව: ..........................

7.3 බැංකු ශාඛාව: ........................................................................................................................

7.4 බැංකු රිසිට් පත් අංකය : ..........................................................................................................

7.5 දිනය : ......................................................................................................................................

බැංකු රිසිට් පත නොගැලවෙන සේ මෙහි අලවන්න.

(බැංකු රිසිට් පතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

8.0 අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, මා විභාගයට අයදුම් කරන්නේ .................... වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් හෝ රුපියල් .......................... ක විභාග ගාස්තුව ............................ බැංකුවේ ..................... ශාඛාවේ ගිණුම් අංක ................................................ යට ................................ දින ගෙවා ලබාගත් රිසිට්පත ඉහත අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශ ලේකම් හෝ අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය විසින් ගනු ලබන තීරණවලට හා සියලු විධිවිධානයන්ට මම එකඟ වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය - ......................................

..................................

අයදුම්කරුගේ අත්සන

## කම්කරු විනිශ්චයාධිකාර සභාපති/අතිරේක මහේස්ත්‍රාත්ගේ සහතිකය

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය* මෙම විභාගයට මීට පෙර පෙනී සිටි/නොසිටි* බවත්,
3. ඔහු ඇය විභාගයට අයදුම් කරන්නේ ............ වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් කිරීමට සුදුසු බවත්/ නියමිත විභාග ගාස්තුව ගෙවා එම බැංකු රිසිට්පත අලවා ඇති* බවත්,
4. නිලධාරියා/ නිලධාරිනිය*.......................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්,
5. නිලධාරියා/ නිලධාරිනිය* මෙම විභාගයට පෙනී සිටීම සුදුසු බවත්,

මම සහතික කරමි.

*අනවශ්‍ය වචන කපා හරින්න.

.......................................................................................

කම්කරු විනිශ්චයාධිකාර සභාපති/අතිරේක මහේස්ත්‍රාත්ගේ

අත්සන හා නිල මුද්‍රාව

නම - ..........................................................................................................

පදවිය - ......................................................................................................

ලිපිනය - .....................................................................................................

දිනය - ........................................................................................................